

## අවුරුදු කුමරා ආ දා

එරබදු ගස්වල රත් පැහැ ඇඳුමෙන්
මල් සැරසී පිපිලා
කොවුල්හඬ ඇසේ කන්කළු වන ලෙස
දසතම රැව් දීලා

කෝකිල ගීයට තාලය එක්කොට
රබන් සුරල් වැයෙනා
රබානෙ තාලෙට ඔන්චිල්ලාවට
ගමන මතක්වෙනවා

අහසේ හිරු රැස් විහිදී යන විට
පොළවේ කිරි උතුරා යනවා
කැවුම් කෙසෙල් කැන් සුවඳ විහිදමින්
ගේ මැද සාලේ හිනැහෙනවා

අළුත් ඇඳුම් ඇඳ තැගි බෝග ගෙන
හැම දෙනාම නෑගම් යනවා
හිත්වල සතුටයි හරි සිරියාවයි
අවුරුදු කුමරා පැමිනුණ දා

***තිලානි ප්‍රියංවදා රත්නායක***
**කු ශුද්ධවූ පවුලේ බා. ම. විදුහල**
**කුරුණෑගල Sri Lanka**

**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail. ඔබෙ ලිපි හා කවි තැපෑලෙන් හෝ පැක්ස් මගින් අප වෙත එවන්න**



**Children's Corner**

## National anthems ජාතික ගී

Greece has the longest national anthem - all 158 verses of it. It is based on the Hymn To The Freedom - 158-verse poem written by a Greek poet Dionysios Solomos. Uruguay has the second-longest anthem, with 105 bars of music. The record for the shortest anthem goes to Uganda, with just nine bars..

**ලෝ**ව දිගම ජාතික ගීය තිබෙන්නේ ග්‍රීසියේය. එය ගී කොටස් 158 කින් යුක්තය. එම ජාතික ගීයට පසුබිම් වූයේ සැබැවින්ම පද්‍ය 158 කි. එය තනන ලද්දේ ග්‍රීසියේ ජාතික කවියා ලෙස සම්භාවනීයත්වයට පත් ඩයෝනිසියෝස් සොලමෝස් විසිනි. දෙවන දිගම ජාතික ගීය ඇත්තේ ලතින් ඇමරිකානු රටක් වන උරගුවේය. එහි සංගීත ඛණ්ඩ 105 ක් අඩංගුය. දැනට වාර්තා වී ඇති කෙටිම ජාතික ගීය ඇත්තේ අප්‍රිකානු රාජ්‍යයක් වන උගන්ඩාවේය. සංගීත ඛණ්ඩ 9 ක් පමණක් එම ගීයේ අන්තර්ගතය.

♦ ***Auntie Ramani ( රමණී නැන්දා )***

## සුරපුරයක්

සඳරැස් වැටිලා ගෙමිදුල
ලස්සන රටා මවනවා
සේපාලිකා මල් පිපිලා
දසතේ සුවඳ හමනවා
මා වවුලෝ ඇවිදින්
පැණිවරකා ගහට
සණ්ඩුකරනවා
මගෙ හිතළඟ සුරපුරයක
සිරිය මැවෙනවා

***සෙව්වන්දි දිව්‍යාංජලී***
**ඊරියගොල්ල ම. විදුහල**
**ඊරියගොල්ල යක්විල**
**Sri Lanka**

## යස ගස වෙමි මම

දෙමින් රස අහර
ජීවත්කරමි මම ඔබ
හුස්මගන්නා සුළඟද
පිරිසිදු කරන්නෙමි මම
කැපෙන අත්තක් පාසා
දිවිය අඩුවෙයි මට
එහෙත් වටිනා
ගසක් වී මම
දෙමිය ආයුෂ
වැඩිය ඔබහට

***ප්‍රභාෂ්වර චන්ද්‍රපද්ම***
**නාලන්දා විදුහල**
**කොළඹ Sri Lanka**


නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

**BANK OF CEYLON (UK) Ltd.**

ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
දැන් විවෘතයි...!

- ඉතිරිකිරීමේ ගිණුම්
- ජංගම ගිණුම්
- ස්ථාවර තැන්පතු
- ළමා ඉතිරිකිරීමේ ගිණුම්
- ආයතනික ගිණුම්
- ලංකා බැංකු ගිණුම් හිමියන් සඳහා නොමිලේ මුදල් පැවරුම්
- පුද්ගලික හා ආයතනික ණය පහසුකම්
- ආනයන/අපනයන මූල්‍යකරණය
- භාණ්ඩාගාර සේවාවන්
- විදේශ විනිමය සේවාවන්
- සංචාරක කටයුතු සඳහා බැංකු සේවාවන්

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD





# Two 7 year old computer whizz kids from Harrow - London, passed GCSE in ICT



**Tashane Akarawita**
**ටෂේන් අකරවිට**

Last month, Tashane Akarawita and Zayn Baig, two young kids from London's Harrow county schools have passed GCSE in ICT( Information and Communications Technology). Both of them are just 7year olds.

Zayn, a pupil at Reddiford School, in Cecil Park, passed with a **B** grade, while Tashane who attends Cannon Lane Junior School, in Cannonbury avenue, passed with a **C** grade and wants to be a pilot or a computer programmer in the future.

His mother Menaka said that Tashane was a self-learner.

" At the age of two he learned the alphabet and then he started to type the alphabet on my computer.

" When he started learning simple words he would type them on the keyboard. He was typing even before he learned to write.

" He is a master in short -cuts on the computer and what takes us ages to do, he does very quickly.

" We are really happy for him and glad he passed an ICT exam at such young age." said Menaka.

Tashane attends Sunday Dhamma classes in London Buddhist Viharaya. He is a charming and obedient boy very keen on learning. He is the eldest son of a Sri Lankan Sinhala couple - Upul and Menaka Akarawita - residents of Pinner in Harrow - London.

**(Courtesy - Harrow Times)**

## තොරතුරු තාක්‍ෂණයට දක්‍ෂ දරුවෙක්

**එ**ංගලන්තයේ හැරෝ ප්‍රාන්තයේ පාසැලක ඉගෙනුම ලබන ටෂේන් අකරවිට නමැති ශිෂ්‍යයාගේ වයස අවුරුදු **7** කි. එහෙත් ඒ වයසේ වෙනත් දරුවන්ට නොහැකි ඔහුගේ පුදුම දස්කමක් ගිය මස අපට දැනගන්නට ලැබිණ. එනම් ඔහු අධ්‍යාපන පොදු සහතික පත්‍ර (අ පො ස **GCSE** ) විභාගයේ තොරතුරු තාක්‍ෂණ විෂයෙන් (ICT) සී සාමාර්ථයක් ලබා ඇති බවයි. හැරෝ ප්‍රාන්තයේ තවත් පාසැලක ඒ වයසේම තවත් ඉන්දීය දරුවෙක් ද එම විෂයෙන් සමත්ව ඇති බවද සැළවේ. මේ දරුවන් දෙදෙනාගේ එම අපූර්ව දක්‍ෂතා අගයමින් හැරෝ ටෛම්ස් **(Harrow Times)** පුවත්පතේ ලිපියක් පසුගියදා පළවී තිබුණේය.

ටෂේන්ගේ අපූර්ව දක්‍ෂතාව ඔහුගේ මව වන මේනකා පැහැදිලි කරන්නේ මෙසේය.

" අපේ පුතා වයස අවුරුදු දෙකේ ඉඳලම කම්පියුටර් අල්ලන්න ඒ යතුරු ඔබන්න ටයිප් කරන්න ආසයි. එයා ඒ ටයිප්කිරීම තනියමයි ඉගෙන ගත්තෙ. ඒ තරම් කුඩා කාලෙදි හෝඩිය ඉගෙන ගත්තා විතරක් නෙවෙයි, වචනයක් ඇහුවම මගේ කම්පියුටර් එකේ ඒ වචනෙ නිවැරදිව ගහලා පෙන්නනවා. අකුරු ලියන්නවත් නොදන්න ඒ කාලෙ අකුරු අඳුනගන විතරක් නෙවෙයි ඒවා ටයිප් ගහල පෙන්නන්නත් එයා දැනගෙන හිටියා......

අපිට හරි සංතෝෂයි අපේ පුතා මෙතරම් කුඩා වයසෙදි ලොකු ළමයින් පාස්කරන විභායකින් ජයගැනීම...... " මේනකා කියයි.

ටෂේන් සෑම ඉරිදාවකම ලන්ඩන් බෞද්ධ විහාරය පවත්වන දහම් පාසැලේ පන්තිවලට සහභාගි වෙයි. ඔහු බුද්ධිමත් මෙන්ම සුහද, ප්‍රියජනක, කීකරු ළමයෙකි. ටෂේන් ලන්ඩනයේ පිනර් පෙදෙසේ නිවැසි ශ්‍රීලාංකික දැහිතකාමී උපුල් සහ මේනකා අකරවිට යුවළගේ වැඩිමහල් පුත්‍රයාය.

අපි මේ දක්‍ෂ දරුවාගේ දීප්තිමත් අනාගතයට නොවක්ව ඉත සිතින් සුබ පතමු!

ටෂේන්ගේ වැනි ශ්‍රීලංකාවේ සිට ලොව පුරා ගොස් සිටින සියළුම අම්මලා තාත්තලාගේ මූලික අදහස කෙසේ හෝ උගන්වා තම දරුවන් ජීවිතයේ ඉහළම තත්වයට ගෙන එන්නටය. තම මව්බිමෙන් බැහැරව අනුන්ගේ රටක දිවි ගෙවන ආසියාතිකයිනට වැටහෙන කාරණයක් නම් තමන් අන්ත දුක් විඳිමින් හෝ තම දරුවන්ට ඉහළම අධ්‍යාපනයක් ලබා දුනහොත් එය මේ තරගකාරී ලෝකයේ අනාගතයේදී ඒ දරුවන්ට යහතින් ජීවත්වන්නට උපකාරී වන බවයි. ඒ සඳහා ඔව්හු අප්‍රමාණව කැපවී කටයුතු කරති. අපි ඒ දෙමාපියන්ටද ආචාර කරන්නෙමු. -***Venura***

# අවමංගල්‍ය Obituary



## Mrs Piyaseeli Dahanayake Yapa Jayasekera
## පියසීලි දහනායක යාපා ජයසේකර මහත්මිය

නැසීගිය දොස්තර දොන් ආතර් ජයසේකර මහතාගේ ආදරණීය භාර්‍යාව වූද, නාලිනී (ඕස්ට්‍රේලියාව), පද්මිණී (එංගලන්තය) හා මහින්දගේ ආදරණීය මෑණියන් වූද, සෑම් සමරසේකර (ඕස්ට්‍රේලියාව), ශාන්ත සේනාධීර (එංගලන්තය) හා මල්ලිකාගේ ආදරණීය නැන්දම්මා වූද, මනීෂා සහ නෙෂාන් (එංගලන්තය), කල්ෂා සහ චන්දිම (ඕස්ට්‍රේලියාව), චතුර, දිනූ සහ රජීව් (එංගලන්තය), පුබුදු හා ඉසුරු යන අයගේ ආදරණීය ආත්තම්මා වූද, සියරා, කවීෂ් (ඕස්ට්‍රේලියාව), තවීෂ් (එංගලන්තය) යන දරුවන්ගේ මී ආත්තම්මා වූද, පියසීලි දහනායක යාපා ජයසේකර මහත්මිය වසර **89** ක් ආයු වළඳා **2011** පෙබරවාරි **28** වන දින අභාවප්‍රාප්ත වූවාය. අවසන් කටයුතු කොළඹ බොරැල්ල ප්‍රධාන සුසානභූමියේදී මාර්තු මස **3** වන දින සිදුකරන ලදී. එම අවමංගල්‍යයට පැමිණි හැම දෙනාටත්, මල්වඩම් හා ශෝකප්‍රකාශ එවූ සැමටත්, නොයෙක් අයුරින් උදව් උපකාර කළ සියළු දෙනාටත් ස්තූතිවන්ත වෙමු.

**No.4, Stanhope Road, Barnet, Herts EN5 2QN**